## ඇගයුම් පවත්වන දිනවල මගේ ළමයා පාසැලට නොපැමිණිය හොත් කුමක් සිදුවේද?

පරීක්ෂණ පවත්වන අවස්ථාවේ පාසැලට නොපැමිණි සිසුන් සඳහා පාසලේ පරීක්ෂණ පැවැත්වෙන සතිය තුළදී වෙන වේලාවක එම මගහැරුනු පරීක්ෂණ නිම කිරීමට පාසැල විසින් හැකි සෑම විටකම කටයුතු සලසනු ඇත.

2019 මැයි 17 වන සිකුරාදා දිනයෙන් පසුව පරීක්ෂණ වලට පෙනී සිටීමට සිසුන්ට අවසර නැත.

## NAPLAN 2019 කාල සටහන

| | | 14 මැයි<br>අඟහරුවාදා | 15 මැයි<br>බදාදා | 16 මැයි<br>බ්‍රහස්පතින්දා |
|---|---|---|---|---|
| 3 වසර | භාෂා සම්මතයන්<br>මිනිත්තු 45<br>ලිවීම<br>මිනිත්තු 40 | | කියවීම<br>මිනිත්තු 45 | සංඛ්‍යා හැකියාව<br>මිනිත්තු 45 |
| 5 වසර | භාෂා සම්මතයන<br>මිනිත්තු 45<br>ලිවීම<br>මිනිත්තු 40 | | කියවීම<br>මිනිත්තු 50 | සංඛ්‍යා හැකියාව<br>මිනිත්තු 50 |
| 7 වසර | භාෂා සම්මතයන<br>මිනිත්තු 45<br>ලිවීම<br>මිනිත්තු 40 | | කියවීම<br>මිනිත්තු 65 | සංඛ්‍යා හැකියාව<br>මිනිත්තු 65 |
| 9 වසර | භාෂා සම්මතයන<br>මිනිත්තු 45<br>ලිවීම<br>මිනිත්තු 40 | | කියවීම<br>මිනිත්තු 65 | සංඛ්‍යා හැකියාව<br>මිනිත්තු 65 |

## මගේ ළමයාගේ කාර්ය සාධනය මනින්නේ කෙසේද?

එක් එක් පරීක්ෂණයේදී යම් ශිෂ්‍යයෙක් විසින් පෙන්වන ලද කුසලතා ජාතික සාධන පරිමාණයක් මගින් පෙන්නුම් කරනු ලැබේ. ජාතික අවම ප්‍රමිතියක ප්‍රතිඵලයකින් පෙන්වා දෙන්නේ සිසුවා එම වසර මට්ටමේ සහභාගිවීමට අවශ්‍යවන මූලික සාක්ෂරතා සහ සංඛ්‍යා හැකියා නිපුණතා පෙන්නුම් කර ඇති බවයි.

වසරේ පසු දවසක NAPLAN පුද්ගලික වාර්තාවක් ඔබේ ළමයාගේ පාසල පාසල විසින් නිකුත් කරනු ඇත. ඔබට වාර්තාවක් නොලැබුනොත් ඔබ ඒ ගැන ළමයාගේ පාසල අමතන්න.

## NAPLAN ප්‍රතිඵල ප්‍රයෝජනයට ගන්නේ කිනම් ආකාරයටද?

- ගුරුවරු සමග ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා සිසුන්ට සහ දෙමාපියන්ට පුද්ගලික ප්‍රතිඵල උපයෝගී කරගත හැකිය.
- වැඩිතර අභියෝග හෝ අමතර ආධාර තුලින් උපකාරී විය හැකි සිසුන්ව වඩා හොඳින් හඳුනාගැනීම සඳහා ගුරුවරු මෙම ප්‍රතිඵල උපයෝගී කරගනී.
- ඉගැන්වීම් වැඩ සටහන්වල ශක්තීන් සහ දුර්වලකම් හඳුනාගැනීම සඳහාත් සාක්ෂරතා සහ සංඛ්‍යා හැකියා පිළිබඳ ඉලක්ක සැකසීම සඳහාත් පාසැල් විසින් මෙම ප්‍රතිඵල භාවිතා කරනු ලැබේ.
- වැඩ සටහන් සහ පාසැල් වලට සපයනු ලබන ආධාර සමාලෝචනය කිරීම පිණිස පාසැල් පද්ධති විසින් මෙම ප්‍රතිඵල භාවිතා කරනු ලැබේ.
- පාසල් NAPLAN ප්‍රතිඵල වල සාමාන්‍යය **myschool.edu.au** වෙතින් ප්‍රජාවට බලාගත හැකිය.

## මට වැඩිදුර තොරතුරු ලබා ගත හැක්කේ කොතැනින්ද??

NAPLAN ගැන වැඩිදුර තොරතුරු සඳහා:

- ඔබේ ළමයාගේ පාසැල අමතන්න
- ඔබේ ප්‍රදේශයේ විභාග පරිපාලන අධිකාරිය අමතන්න **nap.edu.au/TAA**
- **nap.edu.au** වෙත යන්න

NAPLAN පිළිබඳ පෞද්ගලික තොරතුරු ACARA විසින් පාවිච්චි කරනු ලබන අන්දම ගැන තොරතුරු සඳහා **nap.edu.au/naplanprivacy** වෙත යන්න.